# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 937/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 31/07/2023 පැය 1000

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ඓතිහාසික ගැටබරු ඇසළ රන්දෝලි පෙරහැර හේතුවෙන් විකල්ප මාර්ග භාවිතා කිරීම.**

ගැටබරු ඇසළ රන්දෝලි පෙරහැර 2023.07.25 වන දින සිට 2023.08.03 වන දින දක්වා පැවැත්වෙන අතර 2023.08.01 වන දින රන්දෝලි මහ පෙරහැර දෙනියාය අකුරැස්ස මාර්ගයේ දහවල් 01.00 සිට රාත්‍රී 10.00 දක්වා වීදි සංචාරය කිරීමට නියමිතව ඇත.

එම කාලය තුල දෙනියාය අකුරැස්ස මාර්ගයේ දැඩි රථවාහන තදබදයක් ඇති විය හැකි බැවින් හැකිතාක් පහත සඳහන් විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් සහ රියදුරන්ගෙන් ඉල්ලා සිටියි.

## විකල්ප මාර්ග

### අකුරැස්ස දෙස සිට දෙනියාය දෙසට ගමන් ගන්නා බර වාහන.

- පිටබැද්දර හන්දියෙන් පස්ගොඩ මාර්ගයේ පස්ගොඩට පැමිණ මාතර කොටපොල මාර්ගයේ ඌරුබොක්ක හරහා බෙරලපනාතර නගරයෙන් තලපලාකන්ද මාර්ගය හරහා දෙනියාය 51 හන්දියට පැමිණ දෙනියාය නගරය වෙත ගමන් කල හැක.

### දෙනියාය දෙස සිට අකුරැස්ස දෙසට ගමන් ගන්නා බර වාහන.

- දෙනියාය අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ 51 හන්දියෙන් හැරී තලපලාකන්ද මාර්ගයේ බෙරලපනාතර නගරයට පැමිණ කොටපල මාතර ප්‍රධාන මාර්ගයේ ඌරුබොක්ක මාර්ගය හරහා පස්ගොඩට පැමිණ පස්ගොඩින් සියඹලාගොඩ මාර්ගයේ පිටබැද්දර දක්වා ගමන් කල හැක.

**අකුරැස්ස දෙස සිට දෙනියාය දෙසට ගමන් ගන්නා සැහැල්ලු වාහන.**

- අකුරැස්ස දෙනියාය ප්‍රධාන මාර්ගයේ ගල්දොල හන්දියෙන් බෙංගමුව මාර්ගයේ පැමිණ කොස්මෝදර හරහා කොරව මාර්ගයේ TRI හන්දියෙන් දෙනියාය අකුරැස්ස මාර්ගයට පිවිසිය හැක.

**දෙනියාය දෙස සිට අකුරැස්ස දෙසට ගමන් ගන්නා සැහැල්ලු වාහන.**

- දෙනියාය අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ TRI හන්දියෙන් කොරව මාර්ගයේ කොස්මෝදර හරහා කොටපල බෙංගමුව මාර්ගයට පැමිණ ගල්දොල හන්දියෙන් දෙනියාය අකුරැස්ස ප්‍රධාන මාර්ගයට පිවිසිය හැක.

ඒ අනුව ඉහත දින පෙරහැර පැවැත්වෙන කාල සීමාව තුල දෙනියාය දෙස සිට අකුරැස්ස දෙසට යාමට පැමිණෙන වාහන හැකිතාක් ඉහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට ඔබ මාධ්‍ය ආයතනය මගින් ප්‍රචාරයක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**